IPRC/24/139 Social Sciences and Humanities

# බඹරු ඇවිත් සහ අහස්ගව්ව චිත්‍රපට මගින් නිරූපණය වන සමාජ ගැටළු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**එල්.ජී.එස්.යූ. සඳරුවන්[1,2]*, ආර්.එම්.එන්.යූ. බණ්ඩාර[1,2], එම්. පියුමාලි[3]**

[1]නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
[2]ලලිත කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
[3]ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
[1]මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
[3] සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

සමාජයේ පවතින කිසියම් තත්ත්වයක් හේතුවෙන් සමාජයේ සිටින බොහෝ දෙනකුගේ යහපැවැත්ම ඉෂ්ට කර ගැනීමට නොහැකි වීම සරලව ම සමාජ ගැටළුවක් ලෙස හැඳින්විය හැක. එම සමාජ ගැටළු සමාජයේ ජීවත්වන සියලුම දෙනාට සෘජුව ම හෝ වක්‍රව බලපෑම් එල්ල කළ හැක. සමාජය ආරම්භයේ සිට වර්තමානය දක්වා ම ජන සමාජයට මුහුණ පෑමට සිදු වූ ගැටළු රාශියක් ඇත. ඒවා අතර ගණිකා වෘත්තිය, දරිද්‍රතාවය, යාචක ප්‍රශ්නය, මත්ද්‍රව්‍ය භාවිතය හා විරැකියාව ප්‍රධාන වේ. එම සමාජ යථාර්ථය, ලෝක සිනමාව මගින් ද ලාංකේය සිනමාව මගින් ද නිරූපණය කරන්නට සිනමාකරුවන් උත්සුක වූහ. ශ්‍රී ලාංකික ජන සමාජයේ මතුවූ සමාජ ගැටළු ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කළ සිනමා අධ්‍යක්ෂකවරයකු ලෙස ධර්මසේන පතිරාජ හැඳින්විය හැක. එමෙන්ම සිංහල සිනමාව යොමු විය යුතු නිවැරදි මාර්ගයට යොමු කළ සිනමා අධ්‍යක්ෂකවරයකු ලෙස ධර්මසේන පතිරාජ හැඳින්විය හැක. ඔහු මිනිස් ජීවිතයට වඩාත් සමීප, යථාර්ථ රූපී අත්දැකීම් වෙත ප්‍රේක්ෂක මනස යොමු කිරීමට උත්සාහ කළේය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ධර්මසේන පතිරාජ ඔහුගේ චිත්‍රපට සඳහා විෂය කරගත් සමාජ ගැටළු පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ධර්මසේන පතිරාජ විෂය කර ගත් සමාජීය ගැටළු මොනවාද යන්න මෙම පර්යේෂණයේ, පර්යේෂණ ගැටළුව වේ. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කෙරුණි. ප්‍රාථමික දත්ත වශයෙන් අහස් ගව්ව හා බඹරු ඇවිත් යන චිත්‍රපට ද්විත්වය නරඹා එහි අන්තර්ගතය, අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කෙරුණි. එමෙන් ම ද්විතීයික දත්ත ලෙස දේශීය විදේශීය ග්‍රන්ථ ද, තෘතීය දත්ත ලෙස අන්තර්ජාලය ද පරිශීලනය කෙරුණි. මෙම පර්යේෂණයේ, පර්යේෂණ ප්‍රතිඵල ලෙස එවකට පැවති දේශපාලනය, විරැකියාව, පන්ති භේදය, දරිද්‍රතාවය යන සමාජ ගැටළු මෙම චිත්‍රපට මගින් නිරූපණය කර ඇති බව අනාවරණය විය. ඒ අනුව මෙම පර්යේෂණයේ නිගමනය ලෙස විරැකියාව මගින් එවකට සිටි තාරුණ්‍යය සීමාවට පත්වන අයුරුත්, සමාජයේ පවත්නා පන්ති භේදය, දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගේ ජීවන යථාර්ථය හා ඔවුන්ගේ පීඩනය මෙම චිත්‍රපට මගින් නිරූපණය කර ඇත.

**මුඛ්‍ය පද:** අහස් ගව්ව, ධර්මසේන පතිරාජ, බඹරු ඇවිත්, සමාජීය ගැටළු, සිනමාව

*lgsus231@kln.ac.lk
ORCiD ID: https://orcid.org/0009-0009-2118-9790